www.kidworship.kr

# එලියා

– 25th Story–


180Page

පොතේ ගුරා — මේ ආහබ් රජතුමාගේ කාලයයි. ආහබ් රජු ඉශ්රායෙල් කෙරෙහි ආණ්ඩු කරමින් සිටියා. ආහබ් යනු දෙවියන්වහන්සේ විශ්වාස කළ අයකු නොවන අතර ඔහු සේවය කළේ අන්‍ය දෙවියෙකු වන බාල් ට ය.
මේ කාලයේ දෙවියන්වහන්සේ ප්‍රොපේතෘවරයෙකු ලෙස එලියා ඉශ්රායෙල්ට පිටත් කරනු ලැබුවා.

එලියා — අපි මේ වගේ රූප වලට නමස්කාර කරන්නේ නෑ.
දෙවියන්වහන්සේ පමණයි එකම එක ස්වාමින්වහන්සේ...

පොතේ ගුරා — එලියා, ඉශ්රායෙල් ජාතියට දෙවියන්වහන්සේගේ වචනය බෙදාදීම උදෙසාම තම මුලු ජීවිත කාලයම කැප කරමින් සිටියා.

දෙවියන්වහන්සේ — එලියා සීදොන් දේශයේ ශාරපෙත්වලට දැන් යන්න. ඔබ ගොස් එහි නැවතී සිටින්න.

එලියා — ඔව් ස්වාමිනි ! මම ඔබ කී ලෙසම කරන්නෙමි.

පොතේ ගුරා — එක් දවසක් ශාරපෙත්වලට යන්නයි දෙවියන්වහන්සේ එලියාට කිව්වා. එහිදී ඔබට එක් වැන්දඹුවක් මුණ ගැසේවි කියාත් පැවසුවා.

.................................................................................................


181Page

එලියා — හා හරි බලමු. ම්ම්ම් ... ශාරපෙත් යන්නේ කොහොමද ... (එලියා සිතයි)

පොතේ ගුරා — එලියා ශාරපෙත්ට පැමිණි කළ, දර කෝටු අහුලමින් සිටි එක් කාන්තාවක් දුටුවා. ඇය වැන්දඹුවක්. එලියා ඇයට කතා කළා.

එලියා — මට වතුර ටිකකුත්, රොටි කෑල්ලකුත් ගේන්න ඔබට පුලුවන් ද ?


පොතේ ගුරා — මේ වැන්දඹු කාන්තාව, මොහු දෙවියන්වහන්සේගේ මනුෂයෙකුයැයි හඳුනා ගත්තා. නමුත් ඇය ඇත්තටම දුප්පත් කාන්තාවක්.
ඒ නිසා මේ එලියාගේ ඉල්ලීම ඇයට මහ බර දෙයක් වුණා.

වැන්දඹුව — මගේ ළඟ රොටි නෑ. මා ළඟ ඇත්තේ පිටි මිටකුත්, තෙල් ටිකකුත් පමණයි. ඒවා මා සහ මගේ පුත්‍රයා විසින් කාලා මැරෙන පිණිසයි, මම මේ දර අවුලා ගන්නට ආවේ.

පොතේ ගුරා — එලියා ඇයගේ තත්වය, වාතාවරණය දැනුවත්වයි සිටියේ.

එලියා — මම ඔබගේ වාතාවරණය ගැන දන්නවා. පළමුව නුඹ ගොස් මට රොටිය-ක් පිළියෙල කරගෙන එන්න.
පසුව ඉශ්රායෙල්ගේ දෙවි වූ ස්වාමින්වහන්සේ නුඹේ පිටි සහ තෙල් අඩු නොවන ලෙස තබා ගන්නවා ඇත.

.................................................................................................


182Page

පොතේ ගුරා — පසුව වැන්දඹුව ගොස් එලියා කී ලෙසටම කළාය.
ඉශ්රායෙල් රට මේ වෙද්දි වසර තුනහමාරක් පුරා නියඟයකින් පීඩා විඳිමින් සිටියා. එහෙත් දෙවියන්වහන්සේ කී ලෙස මේ වැන්දඹුවගේ පිටි මුට්ටිය ඉවර වුණේත්, තෙල් කුලාව සිඳී ගියේවත් නැත.



183Page

පොතේ ගුරා: එක්තරා තවත් දිනයක දී... ඉතාමත් දුක්බර දෙයක් සිදුවුණා.
එනම් වැන්දඹුවගේ පුත්‍රයා අසනීපව මරණයට පත්වුණා.
ශාරපෙත් වැන්දඹු ස්ත්‍රිය එලියාට කතා කරමින් මෙසේ කිව්වා...

වැන්දඹුව: (දුක්බර හඬකින්) ඔබට මට විරුද්ධව ඇති දෙය කුමක්ද ?
ඔබ ආවේ මාගේ පාපයන් ගැන මතක් කරලා දීලා, මගේ පුත්‍රයා මරලා දාන්න ද ?

පොතේ ගුරා: වැන්දඹුව හොඳටම හැඬුවාය. එලියා තමාගේ දෑතින් දරුවා ඔසවාගෙන තමා සිටි උඩුමහලට ගොස් දරුවා ඇඳ මත තබා, ස්වාමින්වහන්සේට යාච්ඤා කරන්නට වුණේය.

.................................................................................................



184Page

එලියා: සවාමින්වහන්ස, මට නවාතැන් දුන්, මේ වැන්දඹුවගේ පුත්‍රයා නැසීමෙන් ඔබවහන්සේ ඇයට විපතක් පැමිණුවේ මක්නිසාද?
මේ පුතා මිය ගියේ මම මෙතැන සිටින නිසා ද ?

පොතේ ගුරා: එලියා, තුන් වතාවක් ළමයා තුළ දිගා වෙමින් ළමයාගේ ප්‍රාණය නැවත දුන මැනවයි කීවේය. (හඬමින් යාච්ඤා කිරීමක්)

.................................................................................................




185Page

එලියා: ස්වාමිනි ළමයාගේ ප්‍රාණය නැවත දුන මැනවි ! (හඬමින් යාච්ඤා කරයි)

පිරිමි ළමයා: අම්මේ !! මට බඩගිනියි.

.................................................................................................



186Page

පොතේ ගුරා: දෙවියන්වහන්සේ එලියාගේ හැඬීමේ යාච්ඤාව ඇසූ සේක. දරුවාට නැවත ජීවිතය ලැබුණි.
වැන්දඹුව තම දරුවා රැගෙන බොහෝ සේ ප්‍රීති වූවා.

වැන්දඹුව: ඔබ සැබවින්ම දෙවියන්වහන්සේගේම මනුෂ්‍යයකු බවත්, ඔබගේ මුඛයේ තිබෙන ස්වාමින්වහන්සේගේ වචනය සත්‍යය බවත් දැන් මම දනිමි.

පොතේ ගුරා: ශාරපෙත්හී වැන්දඹුව දෙවියන්වහන්සේට ස්තුති ප්‍රශංසා පුද කළාය.

.................................................................................................

**ජීවිතයට අදාල කිරීම**

ආදර දුවේ පුතේ ....
සල්ලි නැති, කෑම නැති, පාසලට අවශ්‍ය දේවල් ගන්න නැති ඉතාම අමාරු දවස් ඔයාටත් තියෙන්න පුලුවන්.
ඒ වගේ කාලවලදී දෙවියන්වහන්සේට යාච්ඤා කරන්න පුරුදු වෙන්න.
දෙවියන්වහන්සේ කරන මහත් පුදුම දේවල් අත් දකින්න ඔයාටත් පුලුවන්.
අද ඔයාට ඕන දේවල් ලියන්න. ලියලා දෙවියන්වහන්සේට කියන්න.
මේ මේ දේ මට අවශ්‍යයි ඔබවහන්සේ මට ඒවා ලබා දෙන්න කියලා.